**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2014**

**------------------------------------------------------------------------------**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද මෝටර් වාහන පනතේ (203 අධිකාරය) 213 ඈ (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම

පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

2.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

------------------------------------------

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර බිල්පත් පොළී රු. 3,116 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2001 ජුලි 10 දිනැති අංක 17/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වයස අවුරුදු 60 එළඹීමෙන් පසුව විශ්‍රාම ගිය නිලධාරිනියක් 2012 දෙසැම්බර් සිට අරමුදලේ මූල්‍ය පාලක ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන එම නිලධාරිනියට සමාලෝචිත වර්ෂයේ සේවය කරන ලද පළමු මාස 3 සඳහා එකතුව රු.105,000 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 3.2 (අ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා එම මුදල් ආයෝජනය කර ඇති විටෙක, කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතු වුවද, අරමුදලේ රු.42,722,005 ක ශේෂය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 4.1 (අ) ඡේදය | අරමුදලෙහි අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය එහි පාලන අධිකාරිය සහ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 (ඇ) උප ඡේදය පරිදි සියලුම දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කිරීම් කළ යුතු වුවද, එයට පටහැනිව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ වියදම රු.76,995,932ක් විය.

(ආ) ප්‍රවාහන අමාත්‍යාංශයේ සේවය කරනු ලබන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.343,051 ක් දිරිදීමනා ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,225,948 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.4,799,765ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,426,183 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී මෝටර් වාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු, බදු හා අයභාර වලින් අයකරනු ලබන සියයට එකක් වූ ආදායම රු.18,223,888 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෝටර් වාහන සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හා නිර්මාණය වෙනස් කිරීම ආදී කටයුතු

සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සිදු කෙරෙන අනීතික කටයුතු පිළිබඳ තොරතුරු සපයන්නන්ට තෑගි මුදල් ගෙවීම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයටත් එවැනි තොරතුරු ලබා ගැනීමට හා තොරතුරු සපයන්නට තෑගි මුදල් ගෙවීමට අදාල ක්‍රමවේදයන් සකසා ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ සාවද්‍ය ක්‍රියාවන්වල නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳව තොරතුරු සපයන තැනැත්තන්ව බිහි කිරීමත්, එවැනි තොරතුරු සැපයීමට ඔවුන්ව ධෛර්යමත් කිරීමත් මෙවැනි සාවද්‍ය ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිලධාරීන්ව ධෛර්යමත් කිරීමත් ත්‍යාග අරමුදල පිහිටුවීමේ අපේක්ෂිත කාර්යයක් වුවද, එවැනි තොරතුරු සපයන්නන් සහ නිලධාරීන් ධෛර්යමත්වන ආකාරයේ කිසිදු ක්‍රියාකාරකමක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති බවට තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ත්‍යාග හා දිරිදීමනා අරමුදලට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

අරමුදලේ ආදායම් හා වියදම් විචලායන් 6 ක් සම්බන්ධයෙන් අයවැයගත ආදායම හා වියදම, සත්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 26 සිට සියයට 34 දක්වා විචලතා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අයවැය

(ආ) ගිණුම්කරණය